**අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය**
**காணாமல் போன ஆட்கள் பற்றிய அலுவலகம்**
**OFFICE ON MISSING PERSONS**

---

**මාධ්‍ය නිවේදනය** **2019 පෙබරවාරි මස 28**

## <u>අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වසරකට පසු</u>

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (OMP) පිහිටුවා වසරක කාලයක් ගත වීම නිමිත්තෙන් එහි කාර්ය මණ්ඩලය විසින් මාර්තු මාසය තුල වැඩසටහන් මාලාවක් සංවිධානය කර ඇත. 2016 අංක 14 දරන පනත යටතේ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත යටතේ ස්ථාපිත කල මෙම කාර්යාලය 2018 පෙබරවාරි මස 28 වන දින කොමසාරිස්වරුන් පත් කිරීමත් සමග නිල වශයෙන් ක්‍රියාත්මක කරන ලදී.

OMP කාර්යාලයේ මූලික කාර්යභාරය වනුයේ අතුරුදහන් වූ දහස් ගණනක ජනයා සෙවීම සහ සොයා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමය. පසුගිය වසර පුරා මෙම කාර්යාලය විසින් ආයතනික ව්‍යුහයන් සහ ක්‍රියාවලි සැලසුම් කිරීම, ක්‍රියාපටිපාටි සකස් කිරීම අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල් සහ රාජ්‍ය නිලධාරීන් උදෙසා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, යනාදියට අමතරව පරීක්ෂණ ආරම්භ කිරීම, අතුරුදහන්වීම් සම්බන්ධ ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, නීතිය හා ප්‍රතිපත්ති සංවර්ධනය කිරීමට අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම යන කර්තව්‍යන්වල නිරත වී ඇත. 2018 අගෝස්තු මස OMP කාර්යාලය විසින් නිකුත් කළ අතුරු වාර්තාව හරහා අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල් සඳහා අතුරු සහන යෝජනාවලියක්ද, සත්‍ය සොයා ගැනීම හා යුක්තිය පසඳලීම උදෙසා නිර්දේශ ද ඉදිරිපත් කරන ලදී. OMP කාර්යාලය විසින් කරන ලද මෙම නිර්දේශ කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍යය කටයුතු සලසන මෙන් මෙම කාර්යාලය රජයෙන් ඉල්ලා සිටී.

අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල් වල සාමාජිකයන් හට මෙම කාර්යාල වෙත ප්‍රවේශය පහසු කිරීම උදෙසා දිවයිනේ විවිධ ප්‍රදේශ වල ප්‍රාදේශීය කාර්යාල ස්ථාපිත කිරීමට සැලසුම් කර ඇත. මෙහි පලමු පියවරක් ලෙස OMP කාර්යාලයේ පලමු සංවත්සරයට සමගාමීව මාර්තු මස මන්නාරම සහ මාතර යන දිස්ත්‍රික්ක වල ප්‍රාදේශීය කාර්යාල ස්ථාපිත කිරීමට නියමිතය.මන්නාරම ප්‍රාදේශීය කාර්යාලය අංක. 05, දුම්රියපල පාර, මන්නාරම සහ මාතර ප්‍රාදේශීය කාර්යාලය අංක. 54, ධර්මාරාම පාර, කොටුව, මාතර යන ලිපිනයන්හි පිහිටා ඇත.

කැණීම් කටයුතු සිදු කිරීම සහ මානව දේහයන් හදුනා ගැනීම, අතුරුදහන් වූ තැනැත්තන් සෙවීම සහ සොයා ගැනීමේ කර්තව්‍යයන්වල තවත් මූලික අංගයක් වේ. මේ සඳහා රාජ්‍ය ආයතන, අතුරුදහන් වූ

තැනැත්තන් ගේ පවුල් වල සාමාජිකයන් සහ වෙනත් කොටස්කරුවන් සමඟ සම්බන්ධ වීමට OMP කාර්යාලය බලාපොරොත්තු වේ. මෙයට අදාල ක්‍රියාවලීන් සම්බන්ධ මහජන අවබෝධය ගොඩනැගීම උදෙසා OMP කාර්යාලය විසින් 2019 මාර්තු මස 09 වන සෙනසුරාදා දින සවස 5 ට බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවෙහි දී (BMICH) ආර්ජන්ටිනාවේ අධිකරන වෛද්‍යය විද්‍යා කණ්ඩායමේ සභාපති වන, ජාත්‍යයන්තරව පිලිගත් අධිකරන වෛද්‍යයවේදී ආචාර්ය ලූවී ෆොන්ඩබ්‍රියිඩර් (Dr. Luis Fonderbrider, President, Argentinian Forensic Anthropology Team) මහත්මාගේ ප්‍රධානත්වයෙන්, මානව වර්ගයාට ගරු කරන සත්‍ය සෙවීමේ විද්‍යාත්මක ගවේශණයි, (‘Respecting Humanity in the Scientific Search for Truth’) තේමා කරගත් දේශනයක් පැවැත් වේ.

OMP කාර්යාලය අතුරුදහන් වූ තැනැත්තන්ගේ ඉරණම පැහැදිලි කිරීමේ කටයුත්තේ සංකීර්ණභාවය හදුනාගන්නා අතර, එයින් මතු වන අභියෝග මධ්‍යයේ තම කාර්යභාරය ඉටු කිරීමට අවශ්‍යය කටයුතු කිරීමට උත්සහ දරනු ඇත. එමෙන්ම, වින්දිතයින්ගේ සහ ඔවුන්ගේ පවුල් වල සාමාජිකයින්ගේ අයිතීන් සුරක්ෂිත කිරීමට දිගින් දිගටම කටයුතු කරනු ඇත.